# වයඹ පළාතේ පළාත් සභාවේ 1998 අංක 04 දරණ වයඹ සත්ත්ව පාලන ප්‍රඥප්තිය

(වයඹ ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය : 2002.10.18)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ සඳහන් සත්ත්ව පාලනයට සම්බන්ධ විෂයයන් ක්‍රියාත්මක කරමින්, වයඹ පළාතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවන් ඵලදායි හා කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යාම හා ඊට ආනුෂංගික වන කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමත් පිණිස වූ ප්‍රඥප්තියකි..

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය "වයඹ පළාතේ පළාත් සභාවේ 1998 අංක 4 දරණ වයඹ සත්ත්ව පාලන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය. — ලුහුඬු නාමය ක්‍රියාත්මක වන දිනය

## 1 වන කොටස

### වයඹ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

2. ප්‍රඥප්තියේ අරමුණු ඉටු කිරීම සඳහා වයඹ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන දෙපාර්තමේන්තුවක් මෙයින් පිහිටුවනු ලැබේ. — දෙපාර්තමේන්තුව පිහිටුවීම

3. (1) මෙහි මින්මතු "අධ්‍යක්ෂ" වශයෙන් සඳහන් කරනු ලබන වයඹ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ මෙහි 2 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානයා වන්නේය. — දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

(2) දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩලය පත්කිරීම, ඔවුන් ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සහ වෙනත් ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන අදාළ වන්නේය.

(3) දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටුකිරීමට අවශ්‍ය පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශිය සහ ග්‍රාමීය මට්ටමෙන් ආයතන පිහිටුවිය හැක්කේය.

(4) මෙම ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයාට පැවරෙන යම් කාර්යයන් හා එය ඉටු කිරීම සඳහා අවශ්‍ය යම් බලතල 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන අනුව පත්කර ඇති සිය නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකුට හෝ සහකාර අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරයා විසින් පවරා දිය හැකිය.

4. වයඹ පළාතේ සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, සේවා ප්‍රවර්ධනය කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණ වන්නේය. අරමුණ

5. දෙපාර්තමේන්තු අරමුණ ඉටු කිරීම සඳහා සත්ත්ව සෞඛ්‍ය සත්ත්ව අභිජනන, සත්ත්ව පාලන ව්‍යාප්ති කටයුතු හා ඒ ආශ්‍රිත පුහුණු කටයුතු නිසියාකාරව ඉටු කරවීමත්, අවශ්‍ය කළමනාකරණ සම්පත් සලසා ගැනිමත්, මෙම සම්පත් මනා ලෙස කළමනාකරණය කිරීමත් දෙපාර්තමේන්තුවේ වගකිම වන අතර, මෙම වගකීම ඉටු කිරීම සඳහා වයඹ පළාත තුල සත්ත්ව සම්පත් සංරක්ෂණය කිරීම, රැකබලා ගැනිම, වැඩි දියුණු කිරීම හා සත්ත්ව රෝග වැලැක්වීම, මර්ධනය හා රෝගී සතුන් සුවපත් කිරීම මගින් සත්ත්ව නිෂ්පාදන කටයුතු ප්‍රවර්ධනය කරවීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන්නේය. කාර්යභාරය හා වගකීම

6. මෙම ප්‍රඥප්තිය යටතේ දෙපාර්තමේන්තුවේ අරමුණු සපුරා ගැනිමට හා එයට පැවරී ඇති කාර්යයන් හා ඉටු කිරීමට අවශ්‍ය වන්නාවූ සියලු බලතල ලිඛිත නීතියේ සීමාවන්ට යටත්ව දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා සතු වන්නේය. දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්ය භාරය ඉටු කිරීමට අදාළව අධ්‍යක්ෂවරයා විසින් පළාත් සභාවේ විවිධ ආයතන වලින්, පළාත් පාලන ආයතන වලින්, මහජන සංවිධාන වලින් හෝ පුද්ගලයන්ගෙන් යම් තොරතුරක් ඉල්ලා සිටියහොත් ඒ ආයතන සංවිධාන හෝ පුද්ගලයන් විසින් එම තොරතුරු ලබාදිය යුතුය. බලතල

## 11 වන කොටස
## පොදු විධි විධාන

7 (1) "මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද ආයතන වල නඩත්තුව උදෙසා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා වැය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධි විධාන අදාළ වන්නේය." දෙපාර්තමේන්තුවේ මුදල්

(2) ලිඛිත නීතියෙහි විධි විධානයන්ට යටත්ව දෙපාර්තමේන්තුවේ කටයුතු උදෙසා දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා ගැනීමට බාධාවක් නොතිබිය යුතුය.

8. (1) වර්ෂය තුලදී පළාත තුල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා පවත්වා ගන්නා ආකාරය, පැන නැගුණු ගැටළු, ඒවා විසඳීමට ගත් පියවර හා සත්ත්ව සෞඛ්‍ය පිලිබඳ උපනතින් ගැන සඳහන් කෙරෙන වාර්ෂික පාලන වාර්තාවක් එක් එක් වර්ෂය ඉකුත්ව මාස හයක කාලයක් ගතවීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් විෂයභාර අමාත්‍යවරයාට ඉදිරිපත් කළයුතුය. — වාර්ෂික වාර්තා

(2) ඉහත අනු වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද පාලන වාර්තාව අමාත්‍යවරයා විසින් සාධාරණ කාලයක් තුල පළාත් සභාවට ඉදිරිපත් කළයුතුය.

9. දෙපාර්තමේන්තුවේ බලතල ක්‍රියාත්මක කිරීම පිලිබඳව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයාට විශේෂ හෝ සාමාන්‍ය හෝ විධාන ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂවරයා විසින් ඒ විධාන ක්‍රියාත්මක කළයුතු වන්නේය. — විධාන කිරීම

10. (1) මේ ප්‍රඥප්තියෙන් නියම කරනු ලැබූ හෝ නියෝග සෑදීමට බලය දී ඇති හෝ යම් කාරණයක් සම්බන්ධයෙන්ද, පහත සඳහන් කාරණා සම්බන්ධයෙන්ද අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැක්කේය. — නියෝග සෑදීම

(අ) සත්ත්ව පාලනය පිලිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම.
(ආ) දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් ආධාර ලබාගැනීම.
(ඇ) සත්ත්ව පාලනයේ යෙදෙන ජනතාව වෙත පහසුකම් සැපයීම.
(ඈ) හදිසි විමර්ශන කටයුතු කරගෙන යාම.
(ඉ) පාරිශ්‍රමික හා දීමනා.
(ඊ) ආයතන හා සේවාවන්හි කාර්ය සාධනය ඇගැයීම.
(උ) දෙපාර්තමේන්තු කටයුතු විමර්ශනය කිරීමේ විධි විධාන සැලසීම.

(2) 1 වැනි උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලබන දිනයෙහි සිට හෝ නියෝගයේ සඳහන් යම් නියම කරනු ලබන දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(3) 1 වැනි උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින්ම අනුමැතිය සඳහා එය පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබියයුතු අතර, එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් වේතොත් එය අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු කළාසේ සැලකිය යුතු නමුත්, එම නියෝග යටතේ ගනු ලැබූ කවර හෝ ක්‍රියා මාර්ගයක් කෙරෙහි එම අවලංගුවීම බලනොපෑ යුතුය.

(4) යම් නියෝගයක් එසේ අවලංගු කරනු ලැබූ සේ සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

11. **වත්කම් හා දේපල**

මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට පෙරාතුව වූ දිනයෙහි සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය ක්‍රියාත්මක කිරීම උදෙසා යම් වත්කමක්/ බලයක් හෝ දේපලක් හෝ පිරිස් බලයක් යොදවා තිබුනේ නම් හෝ ආකෘතියක්, දැන්වීමක්, බලපත්‍රයක්, ලේඛනයක් හෝ එවැනි ලියවිල්ලක් භාවිතා කළයුතු යයි නියම කර තිබුනේ නම් ඒවා සියල්ල මෙම ප්‍රඥප්තිය යටතේ රජය විසින් පවරා දුන්නා හෝ වෙනයම් ක්‍රමයකින් ලැබුනාවූ හෝ දෙපාර්තමේන්තුවට පැවරී ඇති වත්කම් හා දේපළ වශයෙන් සැලකිය යුතුය.

## 111 වන කොටස

## වරදවල් හා දඬුවම්

12. **ප්‍රඥප්තියේ විධිවිධාන පැහැර හැරීම**

මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ හෝ සම්පාදනය කරන ලද යම් නියෝගයක හෝ විධිවිධාන කඩ කිරීම හෝ ඒ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම හෝ මේ ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සම්පාදිත නියෝග යටතේ හෝ යම් කාර්යයක් පැවරී ඇති අයෙකුට එම කාර්යය ඉටු කිරීම කෙරෙහි චුවමනාවෙන්ම අවහිර කිරීම හෝ ලිඛිත නීතියේ විධි විධානයන්ට යටත්ව මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේය.

13. **දඬුවම**

මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන සැම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වූ ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වියයුතු වන්නේ ය.

14. **අනනුකූලතාවය**

මේ ප්‍රඥප්තියෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් වේ නම් සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතුය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි, අර්ථ නිරූපණය

"පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාත ද ,

"පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා ද,

"අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයය පැවරී ඇති පළාත් අමාත්‍යවරයා ද,

"සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ" යන්නෙන් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන යටතේ පත්කර ඇති සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා ද,

අදහස් කෙරේ.